සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය
ර/ඇඹි/ මාකඳුර විද්‍යාලය

8 ශ්‍රේණිය - සිංහල | දෙවන වාරය | දහනවවන සතිය

12 වන පාඩම - නිවැරදිව කියවමු

- කියවීමෙන් නිසි පල ලැබීමට නම් එය නිවැරදිව කළ යුතුය.
- ශබ්ද නගා කියවීම තුළින් නිවැරදිව හා පැහැදිලිව කතා කිරීමේ හැකියාව ඇති වන අතර අන්‍යන්ගේ අවධානය යොමු කර ගැනීමට හැකියාව ලැබේ.
- සංස්කෘත ශ්ලෝක උච්චාරණය කිරීමේ දී මහාප්‍රාණ අල්පප්‍රාණ අක්ෂර නිවැරදිව උච්චාරණය කිරීම, ශබ්දය මෙන්ම අර්ථය පිළිබඳ සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය වේ.

ක්‍රියාකාරකම

1. පෙළ පොතේ 99 පිටුවේ ශ්ලෝක දෙක නිවැරදිව ශබ්ද නගා කියවන්න.

2 සංස්කෘත ශ්ලෝක උච්චාරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

3. එම ශ්ලෝක දෙක ඇතුළත් ග්‍රන්ථය කුමක්ද?

4. එම ග්‍රන්ථය කවර වර්ගයකට අයත්වේද?

5. පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

- අටසාළිස්
- පාදපරිචාරිකා
- කලත්‍රපරිග්‍රහය
- මහණ ගොයුම්හු
- පසිඳු
- පවර

6. 'කියවීමේ අගය' යන මාතෘකාව යටතේ වචන 200ක් පමණ වන රචනාවක් ලියන්න.